# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## බදු නියෝජිතයකු ලෙස ලියාපදිංචිය ලබාගැනීමට කැමැත්තක් දක්වන තැනැත්තන් වෙත කෙරෙන නිවේදනයයි.

බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය දැනටමත් ලබාගෙන ඇති ඉහත තැනැත්තන්හට පහත සඳහන් සුදුසුකම් අතරින් එකක් සපුරා ඇත්නම්, බදු නියෝජිතයකු ලෙස ලියාපදිංචිය ලබාගත හැකිය.

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයකු; හෝ

(ii) නීතීඥවරයකු; හෝ

(iii) 2000 අංක 21 දරන ශ්‍රී ලංකා බදුකරණ කාර්යායතන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා බදුකරණ කාර්යායතනයේ සාමාජිකයකු; හෝ

(iv) සමාගම් (විගණකවරු) නියාමන පනත යටතේ විගණකවරයකු ලෙස ලියාපදිංචි වී කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරන ලද තැනැත්තකු වීම; හෝ

(v) බලයලත් නියෝජිතයකු ලෙස ඒ වෙනුවෙන් පනවන ලද නියමයන් යටතේ කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරන ලද තැනැත්තකු; හෝ

(vi) උ.වි. ගෙවීමේ ක්‍රමයට යටත් බදු ගෙවන්නකු වෙනුවෙන් උ.වි.ගෙ. ක්‍රමය යටතේ බදු ආගණනය සඳහා විශේෂඥතාවය ලබා ඇති සමාගම් ලේකම් ලෙස කටයුතු කරන ආයතන හෝ ඒ සමාන කටයුතු කරන ආයතන; හෝ

(vii) පහත සඳහන් සුදුසුකම් සහ ගිණුම් තැබීම පිළිබඳ වසර තුනක පළපුරුද්ද සහිත පුද්ගලයින්;

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ විධායක I මට්ටමේ විභාගය/ ගණකාධිකරණය සහ ව්‍යාපාර පිළිබඳ I මට්ටමේ සහතිකය/ සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරී/ සහතික ලත් බදු උපදේශක;

(ආ) පිරිවැය කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ ව්‍යාපාර ගණකාධිකරණය පිළිබඳ සහතික පත්‍රය;

(ඇ) සහතිකලත් ගණකාධිකාරීන්ගේ වරලත් සංගමයේ වෘත්තීය සුදුසුකම පදනම් මට්ටම;

(ඈ) ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ කළමනාකරණ මට්ටම 03/ අන්තර් මට්ටමේ සහතික පත්‍රය;

(ඉ) ගණකාධිකරණ තාක්ෂණ තාක්ෂණවේදීන්ගේ සංගමයේ සාමාජිකත්වය දැරීම.

1. බදු නියෝජිතයෙකු හට බදු ගෙවන්නා වෙනුවෙන් ඕනෑම බදු වාර්තාවක් පිළියෙල කිරීමට; හා බදු ගෙවන්නාගේ බදු කටයුතු සඳහා බලයලත් නියෝජිතයෙකු ලෙස බදු වාර්තා වලට අදාළ උප ලේඛන පිළියෙල කිරීමට හා එම ලේඛන, වෙබ් අඩවියට උඩුගත (upload) කිරීමේ හැකියාව ඇත.

2. ඉහත ලියාපදිංචිය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ, පළමු මහලේ පිහිටි **"ප්‍රාථමික ලියාපදිංචි කිරීමේ ඒකකය"** වෙත පැමිණීමෙන් ලබාගත හැකිය.

   ඉහත ලියාපදිංචිය යථා කාලයේ දී විද්‍යුත් සේවාව ඔස්සේ ලබාගැනීමට ද ඉඩ සලසනු ලැබේ. මෙයට අදාළව ක්ෂණික උපදෙස් (Quick Guide) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් ද්වාරයෙන් ලබාගත හැකිය. **(බාගත කර ගැනීම ➔ ක්ෂණික උපදෙස් ➔ විද්‍යුත් සේවා)**

**වාර්තා ගෙනවිත් භාරදීමේදී ඇතිවන අවහිරතා වළක්වා ගනු පිණිස, බදු වාර්තා සහ උපලේඛන විද්‍යුත් ගොනුගත කිරීම මගින් ඉදිරිපත් කිරීම සඳහා ඔබ වෙනුවෙන් සලසා ඇති පහසුකම් භාවිතා කරන මෙන් ඔබගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

වැඩිදුර පැහැදිලි කර ගැනීම් සඳහා **දේශීය ආදායම් ඇමතුම් මධ්‍යස්ථානයේ 1944 අංකයට අමතන්න.**

දේශීය ආදායම් වෙබ් අඩවිය - **www.ird.gov.lk**

**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**

IR INLAND REVENUE SRI LANKA

**බදු - වඩා හොඳ අනාගතයකට**